ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 13.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.75 යි.

# 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 12 වන දින.]

එල්. ඩී.-ඕ. 9/97.

**ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්ය සඳහා සහ සියලු ආකාරයෙන් වූ ළමා අපචාරවලට එරෙහිව වූ ක්‍රියා මාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියක් පිහිටුවීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

2. (1) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන, (මේ පනතෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. අධිකාරිය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය :— අධිකාරියේ සාමාජිකයෝ.

(අ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු, මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්,—

(i) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන—

(අ) ජ්‍යෙෂ්ඨ මනෝ චිකිත්සකවරුන් යටත් පිරිසෙයින් එක් කෙනෙක් එහෙත් දෙදෙනකුට වැඩි නොවන සංඛ්‍යාවක් ;

(ආ) ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥවරුන් යටත් පිරිසෙයින් එක් කෙනෙක් එහෙත් දෙදෙනකුට වැඩි නොවන සංඛ්‍යාවක් ;

(ඇ) අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයේ නිරත වෛද්‍ය වෘත්තිකයන් යටත් පිරිසෙයින් එක් කෙනෙක් එහෙත් දෙදෙනකුට වැඩි නොවන සංඛ්‍යාවක් ;

(ඈ) ජ්‍යෙෂ්ඨ මනෝ විද්‍යාඥයන් යටත් පිරිසෙයින් එක් කෙනෙක් එහෙත් දෙදෙනාකුට වැඩි නොවන සංඛ්‍යාවක් ;

(ii) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ ධුරයට අඩු නොවන නිලයක් දරන, නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(iii) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, නියෝජ්‍ය පොලිස්පති ධුරයට අඩු නොවන නිලයක් දරන, පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(iv) නීතිය, ළමා ශුභ සාධනය, අධ්‍යාපනය හෝ වෙනත් ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක පුළුල් පළපුරුද්දක්, සමාර්ථයක් හා පිළිගැනීමක් ඇති බව ජනාධිපතිවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් සාමාජිකයන් පස්දෙනෙක් ; සහ

(ආ) මෙහි පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්, එනම්

(i) පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා ;

(ii) කම්කරු කොමසාරිස්වරයා ; සහ

(iii) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මගින්, ඒ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සංස්ථාපනය කරනු ලැබූ කමිටුවේ සභාපතිවරයා.

සාමාජිකයකු වීමට නුසුදුසුකම්.

4. යම් තැනැත්තෙක් —

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වුවහොත් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම් ; හෝ

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරයි නම් හෝ භුක්ති විඳියි නම් ; හෝ

(ඊ) අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේ දී හානි කර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් දරයි නම්

ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

5. (1) අධිකාරියේ පත් කළ සාමාජිකයකු විසින් තමා ඉල්ලා අස්වන බවට ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් එය පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) අධිකාරියේ පත් කළ සාමාජිකයකු ජනාධිපතිවරයා විසින්, හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ සාමාජිකයකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, 3 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්වෙමින්, ජනාධිපතිවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද, ඔහු විසින් ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දරනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

6. 5 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අධිකාරියේ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු අතර, තවත් එක් ධුර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට එම සාමාජිකයා සුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා.

7. අමාත්‍යවරයා විසින්, තීරණය කරනු ලැබිය හැකි ගෙවීම් ප්‍රමාණයන් අනුව අධිකාරියේ සාමාජිකයන්ට යම් පාරිශ්‍රමික හෝ දීමනා, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා.

8. (1) පරිපාලනය, කළමනාකරණය, නීතිය, ළමා සුභසාධනය, අධ්‍යාපනය හෝ වෙනත් ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක ප්‍රත්‍යක්ෂ පළපුරුද්දක් හා සාමාර්ථයක් ඇති සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින්, අධිකාරියේ සභාපති ධුරයට පත් කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින්, වෙනත් සාමාජිකයකු අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(3) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සභාපතිවරයාට හෝ නියෝජ්‍ය සභාපතිවරයාට ඔහුගේ ධුරයේ කාර්ය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවට කාර්ය ඉටු කිරීම සඳහා අධිකාරියේ වෙනත් සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) ජනාධිපතිවරයාගේ අනුමැතිය නොමැතිව, අධිකාරියේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා, ඔවුන්ගේ ධුරයේ කාර්යයන්ගෙන් බාහිර වූ වැටුප් ලබන කිසිදු සේවා නියුක්තියක නොයෙදිය යුතු ය.

අධිකාරියේ රැස්වීම්.

9. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම්, අධිකාරියේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති නම්, නියෝජ්‍ය සභාපතිවරයා ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර නියෝජ්‍ය සභාපතිවරයා පැමිණ නොමැති නම්, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් යම් සාමාජිකයකු මුලසුන දැරිය යුතු ය.

(2) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හය දෙනකු විය යුතු ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මුලසුන දරන සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට හෝ වෙනත් සාමාජිකයකුට ඔහුගේ ඡන්දයට අමතරව තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(4) මේ වගන්තියේ මීට ඇති පූර්වගාමී විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් අධිකාරියේ රැස්වීම් සම්බන්ධයෙන් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන්, සිය කාර්ය පටිපාටිය විධිමත් කරගත යුතු ය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් අධිකාරියේ ක්‍රියා නිර්බල නොවන බව.

**10.** අධිකාරියේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක්, අධිකාරියේ කිසි ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නාක් සේ නොසැලකිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

**11.** (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කොට සකස් කරගත හැකි අතර, එය අධිකාරිය විසින් නිශ්චය කරන යම් ආකාරයකට වෙනස් කර ගනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(3) අධිකාරියේ අවසරය ඇතිව සහ අධිකාරියේ සභාපතිවරයා හා එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ වෙනත් ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක්, අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ විධානය යටතේ එහි බලතල ක්‍රියාවේ යෙදිය යුතු බව.

**12.** අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී, අධිකාරිය, ළමයින් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය හා සම්බන්ධව ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුකූලව හා ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත නිකුත් කරන පොදු හෝ විශේෂ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

අධිකාරියේ බලතල හා කර්තව්‍ය පවරා දීම.

**13.** (1) අධිකාරිය විසින්, එහි යම් බලතල හෝ කර්තව්‍ය, අධිකාරියේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල සහ කර්තව්‍ය පවරා දෙනු ලැබූ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා විසින් එසේ තමා වෙත පවරා දෙන ලද බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අධිකාරියේ පොදු හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

අධිකාරියේ කර්තව්‍ය.

**14.** අධිකාරියේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම ;

(ආ) ළමා අපචාර වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම ;

(ඇ) එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම ;

(ඈ) අපචාරවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳව සහ ළමා අපචාර වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම ;

(ඉ) ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග ගැනීම සහ උචිත අවස්ථාවල දී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම ;

(ඊ) ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම ;

(උ) සියලු ආකාර ළමා අපචාරවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම ;

(ඌ) ළමා අපචාර හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම ;

(එ) සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම

හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළු කර ගැනීම ;

(ඒ) අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවල දී උචිත පියවර ගැනීම ;

(ඔ) ළමා අපචාර පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම ;

(ඕ) ළමා අපචාරවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහාය වීම ;

(ක) ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම ;

(ග) අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම ;

(ච) ළමා අපචාර සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණ කිරීම ;

(ජ) ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම ;

(ට) ළමා අපචාරවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම ;

(ඩ) ළමා අපචාර පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම ;

(ණ) සියලු ආකාර ළමා අපචාර අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

අධිකාරියේ බලතල.

**15.** අධිකාරියට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම ;

(ආ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි මත, ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම ;

(ඇ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම සහ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඒවා යොදාගැනීම ;

(ඈ) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත් කර ගැනීම ;

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අනුකමිටු පත් කිරීම හෝ පළාත් මට්ටමේ ඒකක සමග සම්බන්ධීකරණය වීම ;

(ඊ) එසේ පත් කර ගන්නා නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය තීරණය කිරීම ;

(උ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභසාධන හා විනෝද පහසුකම් සැපයීම ;

(ඌ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් බාහිර, සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම හා ඒවා ඉටු කිරීම ;

(එ) අධිකාරියේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඒ) සාමාන්‍යයෙන් අධිකාරියේ කටයුතු නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍ය වන වෙනත් සියලු දේ කිරීම.

16. (1) මෙහි මින් මතු "මූල මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන නිලධාරි මූල මණ්ඩලයක් විය යුතු ය. නිලධාරි මූල මණ්ඩලය.

(2) එම මූල මණ්ඩලය මෙහි පහත සඳහන් නිලධරයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ආ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඇ) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඈ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඉ) සමාජසේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයන් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඊ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(උ) කාන්තා කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඍ) කම්කරු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(එ) සංචාරක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඒ) මාධ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ නොවන ධුරයක් දරන, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධරයෙක්.

අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මූල මණ්ඩලය සහාය විය යුතු බව.

17. මූල මණ්ඩලයේ නිලධරයන් අධිකාරියේ සියලු රැස්වීම්වලට සහභාගි විය යුතු අතර අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරියට සහාය විය යුතු ය.

අධිකාරිය අමාත්‍යවරයාට උපදෙස් දිය යුතු බව.

18. අමාත්‍යවරයා විසින්, අධිකාරියේ උපදෙස් මත, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට සාමාන්‍ය හෝ විශේෂ විධාන, ළමා අපචාර වැළැක්වීම සම්බන්ධයෙන් ඒ විධානවල අන්තර්ගත යම් ක්‍රියාවක් කරන ලෙස ඒ යම් දෙපාර්තමේන්තුවට හෝ ආයතනයට නියම කරමින්, නිකුත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

19. (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ව ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් නිලධරයන් හෝ සේවකයන්, අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධරයන්ට සහ සේවකයන්ට, අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව නිශ්චය කරනු ලබන ආකාරයකට හා ගෙවීම් ප්‍රමාණයන් මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, එසේම නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු, අධිකාරියේ ඉල්ලීම මත, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය : නැතහොත් ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු, අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවය නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා අධිකාරියේ සේවය කරන යම් කාලසීමාවක්, එකී සම්මුතියේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කළ කාලසීමාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**20.** (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ ම අරමුදලක් අධිකාරියට තිබිය යුතු ය. අධිකාරියේ අරමුදල.

(2) ඒ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) අධිකාරියට, ඒකාබද්ධ අරමුදලින් ලබා දෙනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ අධිකාරියට දී ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන වියදම් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

**21.** අධිකාරිය වෙත මුදලින් හෝ අන්‍යාකාරයෙන් කෙරෙන සෑම පරිත්‍යාගයක් ම, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද පරිත්‍යාගයක් ලෙස, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**22.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය පිළිබඳව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ අන්තර්ගත විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

රහස්‍යතා ප්‍රකාශන.

**23.** අධිකාරියේ සෑම සාමාජිකයකු ම සහ අධිකාරියේ සෑම නිලධරයකු ම හා සේවකයකු ම, ස්වකීය කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම, අධිකාරියේ කටයුතු හා සම්බන්ධ සියලු කරුණු පිළිබඳව දැඩි රහස්‍යතාවක් පිළිපදින බවට වූ ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය මගින් —

(අ) එසේ කිරීමට අධිකරණයක් මගින් නියම කරනු ලැබූ විට, හෝ

(ආ) ඒ කාරණා අදාළ වන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ඉල්ලා සිටින විට, හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයකට හෝ වෙනත් යම් පනතක විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම සඳහා

හැර, ස්වකීය කාර්ය කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී අපචාරයකට ගොදුරු වී ඇති ළමයකුගේ අනන්‍යතාව පිළිබඳව තමා දැනගත් කරුණු කිසිවක් හෙළිදරව් නොකිරීමට ප්‍රකාශයෙන් ප්‍රතිඥා දෙනු ලැබිය යුතු ය.

වාර වාර්තා හා තොරතුරු.

**24.** (1) මේ පනතේ 14 සහ 15 වන වගන්ති යටතේ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් යමක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ හැකි හා ඉටු කළ හැකි වීමේ කාර්යය සඳහා, අධිකාරිය විසින් හෝ තත් කාර්යය සඳහා අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත ඒ දැන්වීමේ සඳහන්, ඒ

තැනැත්තා දන්නා හෝ ඒ තැනැත්තා සන්තකයේ ඇති ළමයින් හා සම්බන්ධ යම් කටයුතුවලට අදාළ සියලු වාර වාර්තා සහ තොරතුරු අධිකාරිය වෙත හෝ අධිකාරිය විසින් බලය දෙන ලද තැනැත්තා වෙත සපයන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින්, සපයන ලෙස නියම කරනු ලැබූ යම් වාර වාර්තාවක් සැපයීම හෝ තොරතුරක් හෙළිදරව් කිරීම, යම් නීතියක විධිවිධාන යටතේ වැළැක්වී ඇති අවස්ථාවක හැර (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින් යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් සපයන ලෙසට නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ දැන්වීමේ නිශ්චිතව නියමිත කාලය තුළ, ඒ නියමයට අනුකූල වීම, ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් හෙළිදරව් කිරීමට අධිකරණයක් විසින් නියම කර ඇති විට හෝ අධිකාරියේ කර්තව්‍ය ඉටුකර ගැනීමේ කාර්යය සඳහා හෝ හැර, ඒ වාර වාර්තාවක් හෝ තොරතුරක්, අධිකාරිය විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ වෙනත් තැනැත්තකු හෙළිදරව් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ නොකළ යුතු ය.

**25.** අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව, උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වන බව.

**26.** අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එකී කාර්යය සඳහා, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**27.** (1) රජයේ යම් නිශ්චල දේපළක්, අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, ඒ දේපළ රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි හෝ කාර්යයක් සේ සැලකිය යුතු අතර, ඒ අනුව, අධිකාරිය වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හෝ ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

රජයේ චංචල හා නිශ්චල දේපළ, අධිකාරියට ලබාදිය යුතු බව.

(2) රජයේ යම් චංචල දේපළක්, අධිකාරියේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ඒ චංචල දේපළෙහි සන්තකය හා ප්‍රයෝජනය අධිකාරිය වෙත පවරා සතු කර දිය හැකි ය:

එසේ වුවද, රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපළෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නොකළ යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

**28.** (1) අධිකාරියේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද, ඒ දේපළ ඒ කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය සේ සැලකිය යුතු අතර, ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන, අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපළක් රජය විසින් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන යම් මුදලක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**29.** (1) (අ) අධිකාරිය විසින්, මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, අධිකාරියට විරුද්ධව, හෝ

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු

ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට අධිකාරියේ අරමුදලින් එම මුදල ගෙවනු ලැබිය යුතු ය.

**30.** අධිකාරියට විරුද්ධව පවරන ලද කිසිම නඩුවක දී, අධිකාරියේ සාමාජිකයකුට හෝ අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව, පෞද්ගලික වශයෙන් හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය. අධිකාරියේ සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**31.** අධිකාරියේ වැඩ කටයුතු සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක් මත, වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සපයන ලෙස, අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට විධාන කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයාට තොරතුරු සැපයීම.

**32.** අධිකාරිය විසින් වාර්ෂික වාර්තාවක් ඒ වාර්තාව අදාළ වන වර්ෂය ඇතුළත එහි සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව හමුවේ තැබීමට සැලැස්විය යුතු ය. අධිකාරිය විසින් පරීක්ෂා කර බලන ලද යම් විශේෂිත කාරණයක් හෝ කාරණා සම්බන්ධයෙන් සහ ඒ පිළිබඳව ගත් ක්‍රියා මාර්ග සම්බන්ධයෙන්, අමාත්‍යවරයා වෙත වාර්තාවක් සැපයිය යුතු යයි අධිකාරිය සලකන කවර අවස්ථාවක වුවද, අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත වරින් වර හෝ විශේෂ වාර්තා ඉදිරිපත් කළ හැකි ය. වාර්ෂික වාර්තාව.

**33.** යම් පරිශ්‍රයක ළමා අපචාර කටයුතු සිදු කෙරෙන බව විශ්වාස කිරීමට අධිකාරියට සාධාරණ හේතු ඇති අවස්ථාවක, සහ සෝදිසි වරෙන්තුවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම ඒ ළමා අපචාරය පිළිබඳ විමර්ශනයට හානිකර විය හැකි බව විශ්වාස කිරීමට අධිකාරියට සාධාරණ හේතු ඇති අවස්ථාවක, එවැනි යම් පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂා කරන ලෙස, අධිකාරියේ යම් නිලධරයකුට අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි ය. එසේ බලය දෙනු ලැබූ නිලධරයකු මෙහි මින් මතු "බලයලත් නිලධරයා" යනුවෙන් හඳුන්වනු ලැබේ. යම් පරිශ්‍රයකට ඇතුළු වී එය පරීක්ෂා කරන ලෙස අධිකාරියේ යම් නිලධරයකුට බලය දීමට අධිකාරියට බලය ඇති බව.

පරීක්ෂා කිරීමේ හා සෝදිසි කිරීමේ බලය.

**34.** (1) කවර හෝ බලයලත් නිලධරයකු විසින්—

(අ) ළමා රැකවරණය සේවා සපයන කවර හෝ ආයතනයක පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය:

(ආ) ළමයින්—

(i) ළමා අපචාර කාර්යයන් සඳහා ;

(ii) වෙනත් යම් නීති විරෝධී කාර්යයක් සඳහා ;

(iii) නීති විරෝධීව දරුකමට හදාගැනීම සඳහා

යම් පරිශ්‍රයක තබාගෙන ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති අවස්ථාවක, ඒ ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ඇ) නීති විරෝධි දරුකමට හදා ගැනීම සිදු වන්නේ යයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ආරෝග්‍යශාලාවකට හෝ මාතෘ නිවාසයකට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ඈ) ඒ ආයතනය ආරෝග්‍යශාලාව හෝ මාතෘ නිවාසය විසින් පවත්වා ගෙනයනු ලබන යම් පොත්පත්, ලේඛන හෝ වාර්තා පරීක්ෂා කොට, එයින් උධෘත හෝ පිටපත් ලබාගත හැකි ය ;

(ඉ) එවැනි යම් පරිශ්‍රයක සිදු කෙරෙන කටයුතු විමසා දැනගැනීමේ කාර්යය සඳහා සහ ළමයින්ට අදාළ යම් නීතියක් උල්ලංඝනය කිරීමක් ඒ පරිශ්‍රය තුළ සිදුවන්නේ ද යන වග දැන ගැනීම සඳහා, ඒ පරිශ්‍රයෙහි සිටින කවර හෝ තැනැත්තකුගෙන් ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් බලයලත් නිලධරයා වෙත පවරා ඇති යම් බලයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීමේ දී ඊට බාධා කරන හෝ ප්‍රතිරෝධය පාන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම, යටත් වන්නේ ය.

**35.** (1) ළමයින් පිළිබඳ වූ යම් නීතියක් යටතේ යම් වරදක් සිදු කර ඇති බව හෝ සිදු කෙරෙමින් පවතින බව විශ්වාස කිරීමට යම් බලයලත් නිලධරයකුට හේතු ඇත්නම්, ඒ නිලධරයා විසින්- භාණ්ඩ තහනමට ගැනීමේ බලය.

(අ) යම් වරදක් සිදුකර ඇතැයි කියනු ලබන්නේ යම් භාණ්ඩයක් උපයෝගි කරගෙන ද නැතහොත් යම් භාණ්ඩයක් හා සම්බන්ධව ද නැතහොත් වරද සිදු කිරීමට අදාළව යොදාගෙන ඇත්තේ යම් භාණ්ඩයක් ද, ඒ භාණ්ඩය, අවශ්‍ය විය හැකි කාලයකට තහනමට ගෙන රඳවා තබා ගත හැකි ය.

(ආ) එවැනි යම් වරදක් සම්බන්ධයෙන්, යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීමේ දී ඔහුගේ මතය අනුව සාක්ෂියක් සංයුක්ත විය හැකි යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් හෝ යම් යාන්ත්‍රික හෝ විද්‍යුත් උපක්‍රමයක් තහනමට ගෙන රඳවා තබාගත හැකි ය.

(2) යම් බලයලත් නිලධරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් භාණ්ඩයක් තහනමට ගනු ලැබූ අවස්ථාවක, ඒ භාණ්ඩය, ඒ පිළිබඳව පුදුස්සක් කරනු ලබන තෙක්, අධිකාරියේ භාරය සහ පාලනය යටතේ තබා ගනු ලැබිය යුතු ය.

**36.** 33 වන වගන්තිය යටතේ පත් කරන ලද සියලු බලයලත් නිලධරයන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය. බලයලත් නිලධරයන් සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**37.** (1) (අ) මේ පනත යටතේ කරනු ලැබ ඇති යම් නියමයක් අනුව යම් වාර වාර්තාවක් හෝ තොරතුරු සැපයීම පැහැර හරින ; වැරදි.

(ආ) තමන් විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක හෝ තොරතුරක, දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන ;

(ඇ) අධිකාරියේ සාමාජිකයකුව, නිලධරයකුව හෝ සේවකයකුව සිටිමින් හෝ මූල මණ්ඩලයේ සාමාජිකයකුව සිටිමින්, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීමේ දී හෝ කර්තව්‍ය

ඉටු කිරීමේ දී ඒ හා සම්බන්ධව තමන් විසින් ලබාගන්නා ලද සහ ළමා අපචාරයක් සම්බන්ධයෙන් පැවැත්වෙන අපරාධ විමර්ශනයකට සම්බන්ධ තැනැත්තන්ගේ හෝ ළමයින්ගේ අනන්‍යතාව හෙළිදරව් වන යම් කාරණයක් අනාවරණය වීමේ ප්‍රතිඵලය ඇති යම් තොරතුරක් ඒ තොරතුරු හෙළිදරව් කිරීමට මේ පනතින් බලය දී ඇති යම් කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා වෙනත් තැනැත්තකුට හෙළිදරව් කරන ;

(ඈ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන

සෑම තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධාන මගින් යම් වරදක් සම්බන්ධයෙන් ප්‍රකාශිතව විධිවිධාන සලසා නොමැති, මේ පනත යටතේ වූ යම් වරදක් කරන සෑම තැනැත්තෙක් ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(3) මේ පනත යටතේ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට –

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම හා නිලධරයකු ම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම ඒ වරදට

වරදකරු වන ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද සිදුකරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා තිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු විසින් හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) ළමයින්ට අදාළ නීති යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා මූල මණ්ඩලයේ නිලධරයකු හෝ අධිකාරිය විසින් ලියවිල්ලක් මඟින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

**38.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**39.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**40.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"සභාපතිවරයා" යන්නෙන්, 8 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තෙක් අදහස් වේ ;

"ළමා අපචාර" යන්නෙන් —

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ 288ආ 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්තිවල කවර හෝ විධිවිධානයක් ;

(ආ) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි නියුක්ත කිරීමේ පනතේ කවර හෝ විධිවිධානයක් ;

(ඇ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ කවර හෝ විධිවිධානයක් ; නැතහොත්

(ඈ) අධ්‍යාපන ආඥාපනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල කවර හෝ විධිවිධානයක්

උල්ලංඝනය කිරීමක් වන්නා වූ ද, ළමයකුට අදාළව සිදු කරනු ලබන්නා වූ ද, යම් ක්‍රියාවක් නොකර හැරීමක් අදහස් වන අතර, ඊට ළමයාගේ ජීවිතයට අන්තරායක් සිදු වීමට ඉඩ ඇති හෝ ඒ ළමයාට ශාරීරික වශයෙන් හෝ ඔහුගේ හැඟීම්වලට හානි සිදු වීමට ඉඩ ඇති පරිදි ළමයකු සන්නද්ධ ගැටුමකට සම්බන්ධ කර ගැනීම එයට ඇතුළත් වේ.

"නියෝජ්‍ය සභාපතිවරයා" යන්නෙන්, 8 වන වගන්තිය යටතේ පත් කරන ලද, අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා අදහස්වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, හෝ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප හෝ සමාන, බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇති කරන ලද හෝ පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.